# සී/ස නුවරඑළිය විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු

# සාමාන්‍යාධිකාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

සී/ස නුවරඑළිය විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 7/2025 චක්‍රලේඛනය අනුව මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචි සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 202608.07 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ

| | | |
|---|---|---|
| තනතුර | - | සාමාන්‍යාධිකාරී - III |
| වැටුප් පරිමාණ අංකය | - | H.L-01:01 |
| වයස් සීමාව | - | 18-50 (සමුපකාර ක්ෂේත්‍ර නියුතු ස්ථිර සේවකයින්ට වයස් සීමාවන් අදාළ නොවේ.) |
| වැටුප් පරිමාණය | - | 46800-755X10-1135X10-1510X10 = 80850/- |

**සුදුසුකම්** -

(අ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී II ශ්‍රේණියේ වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරක වසර 05 ක්/ සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් /සහකාර සාමාන්‍යාධිකාරී (වාණිජ) තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්) තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමත්වී තිබීම (රාජ්‍ය පරිපාලනය / කළමනාකරණය /වාණිජ ව්‍යාපාර පරිපාලනය/ ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයක උපාධියක් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)/ උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ/ ව්‍යාපාර පරිපාලනය/ මානව සම්පත් කළමනා කරණය සහ ඩිප්ලෝමාවන්ට අදාළව වසර 2 1/2 ක පාඨමාලාවක් සමත් වී තිබීම

හෝ

(ඇ) සමුපකාර සංවර්ධන ආයතනය / පිළිගත් ආයතනයක සමුපකාර ව්‍යාපාරයට අදාළ විෂයයන් ඇතුළත් මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් වීම/ පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් පවත්වනු ලබන සමුපකාර ව්‍යාපාරයට අදාළ මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමත්වීම සමග නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී II ශ්‍රේණියේ වසර 02 ක ස්ථිර සේවා පළලපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරක වසර 03 ක් / සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (වාණිජ) තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්) තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම

නියමිත ආකෘතියට අනුව සැකසූ අයදුම්පත් සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතික පිටපත් ද සමගින් 2026.08.07 දිනට පෙර ගරු සභාපති, සී/ස නුවරඑළිය විවිධ සේවා සමුපකාර සමිතිය, ලෝසන් වීදිය නුවරඑළිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතුය. ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ **"පුරප්පාඩු සාමාන්‍යාධිකාරී තනතුරු සඳහා අයදුම් කිරීම"** ලෙස සඳහන් කළ යුතුය. දැනට සමුපකාර සමිතිවල සේවයේ නියුතු අයදුම්කරුවන් අයදුම්පත් තම සේවා ආයතන ප්‍රධානියා මගින් පමණක් එවිය යුතුය.

**සමිතියේ ගරු සභාපති,**
**සී/ස නුවරඑළිය විවිධ සේවා සමුපකාර සමිතිය.**
**052-2222855**

gazette.lk SINCE 2014 AMBITIONS REALIZED